12/13ශ්‍රේණි සඳහා###

දහඅට සන්නියේ සතර අභිනය භාවිතය

ශාන්තිකර්මයක් යනු ශාන්තිය උදා කරනු වස් පවත්වනු ලබන අභිචාර විධියකි. ප්‍රාථමික වූ ඇදහිලි ක්‍රමයන්ගේ විකාශනයක් වන මෙම පූජා චාරිත්‍ර විශේෂය මිනිසාට ලෞකික වූ පරමාර්ථ සාධනය සඳහා මග පාදයි. ලාංකේය ශාන්තිකර්ම ක්ෂේත්‍රය තුළ සන්නි යකුම හෙවත් දහඅට සන්නිය සුවිශේෂී අංගයක් වනුයේ ඒ තුළ පවත්නා ළගන්නා බව නිසාමය. ආතුරයා හා ප්‍රේක්ෂකයා මූලික කොට සන්නි යකුන් දහ අට දෙනෙකුන්ගේ රංගනයක් මගින් සිංහල ජන සමාජයට මානසික සංතෘප්තියක් දනවනු වස් පවත්වන මෙම ශාන්තිකර්මය නිරන්තරයෙන් සිතැඟි පිනවීම තේමා කරගැනීම විශේෂත්වයකි.

සජීවීභාවය හා ආකර්ෂණය උදෙසා මෙහිදී භාවිත සාම්ප්‍රදායික ලක්ෂණයන්ගේ විශේෂත්වය වනුයේ ඒවායේ පවත්නා නාට්‍යමය ස්වරූපයයි. නාට්‍යයක පවත්නා මෞලික අංගයක් වන සතර අභිනයන්ගේ භාවිතය විසින් අනෙක් ශාන්තිකර්මයන් අතර ආවේණිකත්වයක් ගන්නා මෙම දහඅට සන්නිය සිංහල නාට්‍යයේ ප්‍රභවය පිළිබඳ ශාන්තිකර්ම හා බැඳී පවතින මූලධාර්මික සම්බන්ධය වඩාත් තීව්‍ර කරනු ලබයි. ආතුරයා, ඇදුරා හා අමනුෂ්‍යයන් පාත්‍ර වර්ගයා කොට පෙළපාළි, යක්ෂ රංගන හරහා මතු කරන සතර අභිනයන්ගේ චිත්තාකර්ෂණීය බව රැයක් පුරා සහාගත කරන මෙම ශාන්තිකර්මය පූජාර්ථයේ සීමා පසු කොට විද්‍යාත්මක චින්තනයක් කරා ද ප්‍රේක්ෂකයාගේ මනස කැඳවාගෙන යයි.

ශාන්තිකර්ම

ශාන්තිකර්මයක් යනු යක්ෂ භූතාදීන් නිසා ඇති වන වස්දොස් දුරු කිරීමත් සෙත් ශාන්ති පැමිණවීමත් ලෙඩරෝග සුව කිරීමටත් සිංහල ගැමි ආගම තුළ භාවිත වන පුද පූජා විධියකි. සිංහල ගැමි ආගම හෙවත් බෞද්ධ දර්ශනයෙන් පරිබාහිර වූ සංස්කෘතික පසුබිම තුළ මෙම ශාන්තිකර්ම ප්‍රවර්ධනය විය. ප්‍රාග් බෞද්ධ යුගයේ ලංකාව තුළ වූ ඇනිමිස්ටික් ගණයේ පිදවිලි වෙසෙස් මෙම ශාන්ති කර්ම ආශ්‍රිත පුද පූජා කෙරෙහි වැඩි මූලාශ්‍රයයක් ලබා දී ඇත. ශාන්තිකර්ම තුළ ප්‍රධාන පාත්‍ර වර්ගයා වනුයේ දෙවියන් හා යක්ෂයන්ය. ග්‍රහයන් හා කිසියම් අයුරකින් සම්බන්ධ වූ රාක්ෂය වර්ගයා ද ඇතැම්

ශාන්තිකර්මවල පුද පූජා ලබති. යක්‍ෂයින් පිළිබ`ද පූජා පවත්වන්නන් කට්ටඩියා, යකැදුරා හෙවත් යක්දෙස්සා යයි නම් වන අතර දෙවිවරුන්ගේ කටයුතු කරන්නා කපුරාල, දේවාල පුල්ලියා යැයි හැඳින්වේ.

සිංහල ගැමියා තුළ ශාන්තිකර්ම කෙරෙහි පවතිනුයේ පූජාර්ථයේ හා අභිචාර්ථයේ සංකල්පයකි. පෞද්ගලික වූ අරමුණක් සාක්‍ෂාත් කරනු වස් හෝ සාමූහික අරමුණක් වෙනුවෙන් පවත්වන ශාන්ති කර්මයකදී ඒ වටා ජනකායක් ඒකරාශී වීම ස්වාභාවික වූවකි. එහිදී ප්‍රේක්‍ෂකයන්ගේ මනස ශාන්තිකර්මය තුළ අ◌ාත්මීය කිරීම ශාන්තිකර්ම ශිල්පියාගේ කර්තව්‍යයි. අනුරූපණය, සමාරෝපය, සංවාදය වැනි සජීවී ලක්‍ෂණ හරහා ලෙඩ රෝග ඇති කරන අමනුෂ්‍යයන්ගේ හා තත් ආවේශයන්ගේ විද්‍යමාන බවක් ඇති කර ඒ හරහා ශාන්තිකර්මය හා ආත්මීය වූ ජනයාගේ ඒකාකාරී වූ විඩාබර වූ සිත ප්‍රබෝධමත් කරන අතර රසඥතාවයද තීව්‍ර කරයි. විශේෂයෙන්ම අභිනය භාවිතයෙහි ලා ශාන්තිකර්ම ශිල්පීන්ගේ උපයෝගීතාවය මෙහි ප්‍රධාන වේ.

'අභිනය' යනු කාව්‍යයේ අර්ථය හෝ රසය ප්‍රේක්‍ෂකයන් වෙත ගෙන යන මාධ්‍යයි. අභිනය චතුර්විධය. ඒ වාචිකාභිනය, ආංගිකාභිනය, සාත්විකාභිනය හා ආහාර්යාභිනය වශයෙනි. වාචිකාභිනය යනු වචනය මගින් ඇති කරන රස සංකල්පයයි. ග්‍රීසියේ ඩිතිම්භය මෙන්ම භාරතයේ ස්තෝත්‍ර ගායනය ද වාචිකාභිනයේ මුල් අවස්ථාය. පරළ වීම, ආවේශවීම නැතහොත් සමාරෝපය තුළින් වෙනත් භූමිකාවකට පිවිස තම සකල ශරීරාංගයන් උපයෝගී කරගනිමින් කරන ප්‍රකාශනය ආංගිකාභිනයයි. මුහුණේ මස් පිඬු හකුලාගෙන ඩහදිය කඳුළු වගුරුවාගෙන භාව ප්‍රකාශනය කිරීම සාත්විකාභිනයයි. වෙස් මුහුණු පැළඳීම, නොයෙකුත් වස්ත්‍රාභරණයෙන් සැරසීම ආහර්යාභිනයයි.

තත් චතුර්විධ වූ අභිනයන් හරහා ශාන්තිකර්මයේ සජීවී බව හා ආකර්ෂණීය බව රැකෙන අතර ඒ තුළ ආතුරයාගේ හෝ ප්‍රේක්‍ෂකයාගේ ශාන්තිකර්ම විෂයෙහි වන දෘඪ වූ විශ්වාසය ද තහවුරු වේ. විශේෂයෙන්ම සන්නි යකුම ශාන්තිකර්මය තුළ තත් ක්‍රියාදාමය ප්‍රකටව ප්‍රදර්ශනය වන අතර ඒ පිළිබඳ සියුම් නිරීක්ෂණයෙන් එය ප්‍රත්‍යක්‍ෂ වේ.

# සන්නි යකුම

සන්නිය යන්නෙන් ගම්‍යමාන වනුයේ 'ලෙඩ' 'රෝග' 'ව්‍යාධි' යන අර්ථයයි. වාත, පිත. ශ්ලේෂ්ම යන තුන් දොස් කිපීමෙන් ඇතිවන රෝග දහ අටක් නිවාරණය කරනු ස`දහා සන්නි යකුම පවත්වයි. පහත රට ශාන්තිකර්මයක් වන මෙහිදී මානසික විශ්‍රාන්තිය ලබා දී මනෝ විශෝධක ප්‍රතිඵල ගෙනදීම පිණිස වෙස්මුහුණට සන්නි යක්ෂයන්ගේ රෝග ලක්ෂණ කාවද්දවා ආතුරයා ඉදිරිපිට අනුරූපණය කෙරේ. ඇප නූල් බැඳීම, බෙහෙත් දීම, යන්ත්‍ර, මන්ත්‍ර, ජ්‍යොතිෂය, වෙදකම හා ව්‍යවහාරික බෞද්ධාගමේ ඇදහිලි ද එකට මුහු වී තිබීම දහඅට සන්නියේ ලක්ෂණයකි. දහඅට පාළිය යනුවෙන්ද හඳුන්වන මෙහි සන්නි දහ අටකි. ඒ එක් එක් සන්නියට අදාළ වූ රෝගයන් ද එම`ගින් ප්‍රදර්ශනය කෙරේ. ඒ භූත සන්නිය (උමතු බව) අමුක්කු සන්නිය (වමනය) වාත සන්නිය (හන්දිපත් රුදාව) බිහිරි සන්නිය (බිහිරි බව) ගොළු සන්නිය (ගොළු බව) කණ සන්නිය (අන්ධ බව) පිත් සන්නිය (පිත ආශ්‍රිත රෝග) ඔල්මාද සන්නිය (නන් දෙඩවීම) දෙමළ සන්නිය (නොතේරෙන භාෂාවක් කතා කිරීම) නාග සන්නිය (හීනෙන් නයි පෙනීම) කොර සන්නිය (අවයව වකුටු වීම) වෙඩි සන්නිය (හීනෙන් වෙඩි හඬ ඇසීම) ගිනිජල් සන්නිය (ඇඟ උණුසුම් වීම) ගුල්ම සන්නිය (පාචනය) ජල සන්නිය (සෙම ආශ්‍රිත රෝග) දේව සන්නිය (තැති ගැනීම) වෙව්ලුම් සන්නිය (වෙව්ලීම) මරු සන්නිය මාරාන්තික වීම) වශයෙනි.

සන්නි යකුමේදී රෝග පිළිබිඹු වන්නේ වෙස් මුහුණුවල සංකේත මගිනි. යාග මණ්ඩපය සන්නි යකුම් වීදිමාලාව නම්. මෙය යක් තොරණ තුනකින් හා දේව තොරණ හතරක් වශයෙන් තොරණ සතකින් සමන්විතය. මල් පහන් පුදා හැන්දෑ සමයම නැටීමෙන් අනතුරුව මහ සොහොන් යකා, කළු යකා, රීරි යකා, හූනියම් යකා යන යක්ෂයන්ගේ භූමිකා වෙස් මුහුණු පැළඳ ගත් නර්තකයන් විසින් ඉදිරිපත් කරයි. අනතුරුව පැදුරේ දැපවිල්ල කොට ඒ මතට රීරි යකා පැමිණ පිටවෙයි. අනතුරුව සන්නි යකුන් එන්නට පූර්වාංගයක් වැනි වූ දොළහ පෙළපාළි සබයට එයි. ප්‍රේක්ෂකයන් අවදියෙන් තැබීම, ආතුරයාගේ මානසික තත්ත්වය වෙනස් කිරීම පරමාර්ථ කොට ගත් පෙළපාළිවලින් පන්දම් පාළිය, සලු පාළිය, කෙණ්ඩි පාළිය, තැඹිලි පාළිය, දලුමුර පාළිය, කළස් පාළිය, කුකුළ් පාළිය යනාදිය ප්‍රධාන වේ. යක් පාළිවලින් පසුව සන්නි යකුන් දහඅට දෙනා පැමිණේ. මේ එක් එක් සන්නියට අදාළ වූ රෝග ලක්ෂණ පවතී.

මේ අන්දමට තත් රෝගයට අදාළ රෝග ලක්ෂණ සහිත වූ වෙස් මුහුණක් පැළඳ ඇඳුම් ආයිත්තම්වලින් සැරසී තත් යක්ෂයන් පැමිණෙන අතර කට්ටඩියාගේ පුද පූජා ලැබ

පිටවී යයි. අනතුරුව ඇදුරෝ ආසිරි කවි ගයා දහඅට සන්නිය ශාන්තිකර්මය අවසාන කරති.

දහඅට සන්නියේ සතර අභිනය භාවිතය වාචිකාභිනය

නළු නිළියන් විසින් කැරෙන සංවාද, ගැයෙන ගීත ඒ ඒ හැඟීම් ද්වනිත වන අයුරින්ම වුවහොත් එහි වාචිකාභිනයක් ඇතැයි කිව හැකිය. වචන මගින් රසය ආවහනය කිරීම මෙහිදී සිදු වේ. දහඅට සන්නියේදී යක්ෂයන්ට කෙරෙන ආරාධනා කවි මෙන්ම සංවාද ද එහි වාචිකාභිනයට සාක්ෂ්‍යය දරයි. සලු පාලි සබාගත කිරීමේදී ගුරුන්නාන්සේ සමග මාරුවෙන් මාරුවට කවි පාද කියවීමේදී වරදවා පවසමින් වාචිකාභිනය හරහා හාස්‍ය රසය උපදවන ආකාරය සිත්ගන්නාසුලුය.

ගුරු '　　සත් හට සෙත් දෙන

පාළිය'　　අක්කට මොකවත් නැතිලු

ගුරු '　　සත් හට සෙත් දෙන

පාළිය'　　අයියට මුං ඇට ඕනලු

ජල සන්නිය වෙනුවෙන් ආරාධනා කරනු සඳහා ගයන කව්වලින් ඊට අදාළ වූ රෝගයේ ලක්ෂණ මෙන්ම සන්නි යකුමේ ගීතවත් බවද ප්‍රකට කරවයි.

බඩ හෝ ගාමින් වැටී පෙරලන්නේ - රුජාව ගනිමින් කෑම නොකන්නේ පිටිමුසු පැණි රසමයි ඉල්ලන්නේ 'ජල සන්නිය පුද ඉල්ලා එන්නේ

රීරි යකාගේ ආගමනයේදී තමන්ව බිල්ලට ගන්නා ලෙස අයදිමින් ඇදුරා කරන ප්‍රකාශය ප්‍රේක්ෂකයාට ලබා දෙනුයේ රසඥතා සංකල්පයකි.

අපොයි දෙයියනේ මට ඉන්නට බැරුවා 'සන්ධි කුලල් නහර ද ඇදගෙන කනවා

දුකයි ඉන්න බැරි මගේ පණ මැරුවා' ඉතින් වලාමේ මළක`ද ගෙනියනවා

තමන්ගේ රෝග තත්ත්වය ප්‍රකට වන පරිදි යක්ෂයාට ආමන්ත්‍රණය කිරීම හරහා ආතුරයා තුළ ස්වකීය රෝගය දුරුවන බවට විශ්වාසය ගොඩනැගේ. එමෙන්ම පිදේනි තබා 'අද මෙවෙලේ පටන් අට අනූවක් රෝග නව අනූවක් ව්‍යාධි දෙසියතුනක් අන්තරා කෝටියක් දෝස නිවාරණයි තීන්දුයි'යනුවෙන් සිදුකරන ප්‍රකාශය තුළ ආතුරයා හා ප්‍රේක්ෂකයාගේ මනසෙහි ඇති කරන දෘඪ වූ භක්තිය සුලුපටු නොවේ. සන්නි යකුන්ගේ ආගමනයෙන් පසුද මෙවන් වාචිකාභිනයන් රැසක් සබාගත වේ. මේ අන්දමට සංවාද, කථිකා, කවි හරහා සන්නි යකුම ශාන්තිකර්මයේදී ප්‍රේක්ෂකයා හා යක්ෂයන් අතර ඇති වන බැඳීම රසඥතාවක් කරා ගමන් කරනුයේ නිරායාසයෙනි.

ආංගිකාභිනය

නළු නිළියන් සිය ශරීරාංගය ඒ ඒ අවස්ථාවට උචිත පරිද්දෙන් චලනය කිරීමෙන් ආංගිකාභිනය ඇති වෙයි. එහි සාර්ථකත්වය මතු වනුයේ අවස්ථාවෝචිත වූ අංග චලනය මත ඉරියව් මතුකොට දැක්වීමෙනි සන්නි යකුම තුළ ආංගිකාභිනය හරහා ප්‍රේක්ෂක මනස ඒකාත්මික කරන අයුරු ප්‍රකට වන අවස්ථා බහුලය.

සන්නි යකුන්ගේ ආගමනයට පෙර සිදුවන පෙළපාළිවලදී ආංගික අභිනය බහුල කොට යොදාගනුයේ ප්‍රේක්ෂකයන්ගේ මනස තුළ අළාමක බවක් ඇති කරනු ස`දහාය. පන්දම් පාළියේදී මාත්‍රා තුනෙන් තුනට පාද තබමින් සිදු කරන රංගනය රසාලිප්ත වූවකි. වැලිගම් සම්ප්‍රදායයේ එන දූන්නේ පාළියේ ඇදූරා පාද තබනුයේ සිග්සැග් ක්‍රමයටය. කඩු පාළියේ වේගවත් රිද්මාන්විත බෙර තාලයකට අනුව ගමන් කරයි. සෑම පාළියක් අවසානයේදීම ආතුරයා අබියසට පැමිණ හිස වටා අත් කරකවමින් පිදේනි තබමින් කරන ආ වැඩීම මගින් ආතුරයා සැනසවීම සිදු කරයි.

සූනියම් යක්‍ෂණිය ළඳ බොළඳ තරුණියක ලෙසින් මුල්වරට සබා ගත වීමේදී ලේන්සුවකින් මුහුණ පිස දමමින් මල් ගසමින් පැමිණීම තුළ ඇයගේ තාරුණ්‍යය මතු කිරීමට උත්සාහ දරයි. දෙවෙනි වාරයේදී මහත් වූ උදරයකින් යුක්තව කෝදිරි ගාමින් පැමිණීම හරහා තමන්ගේ ගැබ්බර බව ද තුන් වන වාරයේදී දරුවකු නළවමින් පැමිණ තම ආංගික අභිනය හරහා තමන්ගේ මාතෘත්වය පිළිබ`ද සංඥාවක් ප්‍රේක්‍ෂකයාට ලබා දෙයි.

සන්නි යකුන් පැමිණ ප්‍රේක්‍ෂකයන්ට පෙනෙනා ලෙස කෑ ගැසීම, අත් පොළොවේ ගැසීම, සොටු සීරීම, කෙළ ගැසීම, අතපය රුදා පෙන්වීම, බිම වාඩි වීම, හතර ගාතයෙන්ම දිවීම, කෙ`ද් කොටස් දෙපැත්තට වැනීම, දත් මිටි කෑම වැනි ආංගිකාභිනයන් හරහා ශාන්තිකර්මයේ සජීවී බව මතු කරයි. මරු සන්නියේදී මිනිසුන් භය කරමින් වීදියට නැඟ එය උඩින් කෑ ගසමින් කරන රංගනය තුළ එහි ඇති භයංකාරත්වය ප්‍රේක්‍ෂකයාට අවබෝධ කරවයි. මරහඬ තළා, අත්පුඩි ගසා, අත් වනා, යකැදුරාගේ ඇඟ මත නැඟ සතුටු වී වධ දී පැදුරත් සමඟ තුන් තැනකින් යකැදුරා ඇඟ වටා බැඳ කර පිට තබා යනරී යකාගේ රංගනය තත් යක්‍ෂාවේශයේ මාරාන්තික බව පිළිබඳ හැඟීමක් ඇති කරයි.

යාගය අවසානයේ මහා කෝල සන්නි යකා විසින් බුදුන්ගේ සංදේශය පාදයෙන් අල්ලා යකැදුරාට දෙන අතර ඔහු එය නොපිළිගනී. පසුව ඉනෙහිද බඩෙහි ද තබා ගෙන එන සංදේශය ද නොපිළිගන්නා අතර අවසන හිස මත තබා ගෙන එන අයුරු දැකීමෙන් ප්‍රේක්‍ෂකයා තුළ බුද්ධ ගෞරවය තීව්‍ර වන අතර ශාන්ති කර්මය කෙරෙහි ආගමික වූ නම්‍යතාවක් ද ඇති කරයි. එහිදී යක්‍ෂයා භාවිත කරන ආංගික වූ අභිනය ඒ ස`දහා මනා පිටිවහලක් වේ.

සාත්විකාභිනය

භාවයන් ඉස්මතු කළ යුතු අවස්ථාවන්වලදී උචිත ලෙස හැඟීම් ප්‍රකාශ කිරීමට මුහුණෙන් පිළිබිඹු කරන විවිධ විලාශයන් තාත්වික අභිනය නම්. ඒ ඒ අවස්ථාවලට උචිත පරිදි භාවයන් උද්දීපනය කර දක්වීම තුළ ප්‍රේක්‍ෂකයාගේ මනසෙහි ද භාව උත්කර්ෂණයක් සිදු වේ. සමාරෝපය හරහා යක්‍ෂ ස්වභාවය තමන්ට ආරෝපණය කරගෙන සිටින ඇදුරන් තත් ලක්‍ෂණයන් වෙස් මුහුණු ම`ගින් ප්‍රකාශ කරයි. එහිදී සාත්ත්වික අභිනයන්ගේ ලක්‍ෂණ ස්වාභාවික නොවුණු කෘත්‍රිම වූ මුහුණකින් මනාව විද්‍යාමාන කිරීමට මෙම ශාන්තිකර්ම ශිල්පීන් සමත් වේ.

කොර සන්නියට අදාළ වෙස් මුහුණෙහි තත් රෝගයට උචිත සේ මුහුණ ද ඇදය. එහි එක් නාස් පුඩුවක් අනිකට වඩා උස් වේ. කට වකය. එය දකින ඕනෑම කෙනෙකුට මේ කොර සන්නිය යැයි සංජානනය කර ගැනීමට තරම් ප්‍රාමාණිකය. ගොළු සන්නියේ මුඛය දිගැරී ඇත. කණ සන්නියේ ඇස් පියවී ඇත. අමුක්කු සන්නියේ කම්මුල ඉදිමී ඇත. බිහිරි සන්නියේ නයි පෙණයකින් කන වසා ඇත. දේව සන්නියේ සුදු හෝ කහ පැහැති මුහුණක් වේ. ගිනිජල් සන්නියේ මුහුණ වානර මුඛයක ස්වරූපය ගනී. වැදි සන්නියේ මුහුණ හයාගෙන සිටී. ශ්ලේශ්ම සන්නියේ ඕජස් සහිත සිවිය තුළින් සෙම් සොටු බේරේ. මේ අන්දමට ඒ ඒ භාවයන්හි කම්පිත වන ස්වාභාවික මුහුණක රූපයක් නොවුණද රෝගයට අදාළ වූ ලක්‍ෂණයන්ගෙන් විපරීත වූ වෙස් මුහුණු මෙහි භාවිත කොට ඇත.

මීට අමතරව සූනියම් යක්‍ෂණියගේ ආගමනය තුළ සාත්ත්වික අභිනය ප්‍රදර්ශනය වන ස්ථාන කීපයකි. ගැබ්බර කාන්තාවක් ලෙසින් එන ගමනේදී ඇයගේ මුහුණ තුළ දිස්වනුයේ වේදනාබර, ගම්භීර වූ ස්වභාවයකි. එහෙත් තරුණ ළඳකගේ විලාශයේදී ඊට හාත්පසින්ම වෙනස්ය. ආතුර සන්නියේ දිගටි වූ මුහුණ නිසා එය කාන්තාවකගේ ස්වරූපය ගනී. මහ සොහොන් සමයම් අවස්ථාවේදී යක් දෙස්සාගේ මුලු මුහුණම කළු වර්ණයෙන් ආලේප කොට ඇත. පහන් දැලි භාවිත කොට පොල්තෙල් හා මිශ්‍ර කොට ගත් පාප්ප මුහුණේ තවරයි. ඇස් වටා සුදු පාටින් රේඛාවක් ඇඳ යකාගේ ඇස් උලුප්පවා පෙන්වයි. කළු වර්ණ පසුබිමෙහි කහ වර්ණ දෙතොලට මැදින් ඇති රතු වර්ණය යකාගේ මුහුණට දැඩි රෞද්‍ර බවක් ආරූඪ කරයි. මේ අන්දමට අවස්ථාවෝචිත පරිදි හැ`ගීම් දැනවීමෙහි ලා සන්නි යකුම් ශිල්පීන් රේකයන් වූ බවත් වෙස් මුහුණ ඔවුන්ට බාධාවක් නොවුණු බවත් පැහැදිලි වේ.

## ආහර්යාභිනය

වෙස් ගැන්වීම සඳහා වන ඇඳුම් පැළඳුම් හා වේදිකා සැරසිලි ආදිය ආහර්යාභිනය ලෙස හැඳින්වේ. ඒ ඒ චරිතයට අනුකූල වන සේ වෙස් ගැන්වීම හා ඇඳුම් පැළඳුම් භාවිතය හරහා එම චරිතවල සජීවී බව රැක ගත හැකිය.

ප්‍රේක්‍ෂකයා තුළ රස භාව ජනනයෙහි ලා සන්නි යකුමේ රංගනයන් මෙන්ම තත් පරිසරය ද උදක්ම බලපානු ලබයි. කත්තිරික්ක, විලක්කු, මල් පහන්, පිදේනි ආදියෙන් සැරසෙන තත් වටපිටාව තුළ ප්‍රේක්‍ෂකයා ත්‍රාසාත්මක අවස්ථාවන්ට පත්

කිරීමට අවශ්‍ය පසුබිම සකස් කෙරෙන්නේ යක් බෙරය හා වස් දඬු මගින් මැවෙන නාදයෙනි. සන්නියකුම පවත්වන ප්‍රධාන වීදියද කණු සිටුවා ශක්තිමත්ව අලංකාරව නිමවේ. නේපථ්‍යාගාරය හා සන්නි කූඩුව වීදියේ පසෙකින් නිර්මාණය වීම සන්නියේ කලාත්මක බවට මෙන්ම ප්‍රේක්ෂක දෘෂ්ටියේ විස්තෘත බවට ද බලපායි.

ආහර්යාභිනය හරහා ප්‍රේක්ෂක රසඥතාවයට ඇමතීම සඳහා භාවිත කරන ප්‍රධානම උපකරණය නම් වෙස්මූණයි. සන්නිවල මෙන්ම පෙළපාළිවල ද යොදාගන්නා වෙස් මුහුණු ම`ගින් ප්‍රේක්ෂකයාට විටෙක භීතියද විටෙක හාස්‍යාදී භාවයන්ද ජනිත කරවයි. එක් එක් රෝගයට අයත් ලක්ෂණ තවරාගත් වෙස් මුහුණු නිර්මාණයේදී කළු, රතු, සුදු, කොළ යන වර්ණ ප්‍රමුඛව යොදාගනී. පාලි සඳහා වන වෙස්මුහුණු වඩාත් සක්‍රිය වේ. සන්නි වෙස් මුහුණු වලින් සමහරක නාසයෙන් පහළ කොටස එවැනි ක්‍රියාකාරී ස්වරූපයක් ගනී. ලංකාවේ පමණක් නොව ලොව සෑම සමාජයකම ශාන්තිකර්ම විෂයෙහිලා වෙස් මුහුණු භාවිත වූ ආකාරය ජපානයේ සෙත්සුබුන් නාට්‍යාදිය විමසීමෙන් පෙනේ.

පාළි සහාගත වීමේදී උචිත ඇඳුමකින් හා නාමානුගත සංකේතයක් ද රැගෙන පැමිණේ. තැඹිලි පාළිය අතේ තැඹිලි ගෙඩියකි. සලු පාළිය පැමිණෙන්නේ සලුවක් කරේ දමාගෙනය. කෙණ්ඩි පාළිය අතේ කුඩා කෙණ්ඩියකි. ඔවුන්ගේ ඇඳුම් එතරම් පිරිසිදු නොවන අතර ඉණ හැඩගන්වනුයේ වර්ණවත් වියළි පත්‍රවලිනි.

සන්නියකුමේදී එක් එක් යක්ෂයා සැරසීම සඳහා භාවිත කරන ඇඳුම් විවිධාකාරය. සෑම ශිල්පියෙක්ම වෙස්මුහුණට අමතරව යටට අඳින කළු කලිසම හා කළු හෝ දුඹුරු පාට ටී හැඩයේ කමිසය ද සැරසීම සඳහා යොදාගනී. සූනියම් යක්ෂණිය සුදු සේලයක් ඇඳ සුදු රෙද්දක් පොරවා ගෙන වේදිකාවට පැමිණේ. කෝල සන්නි යකා සහාගත වනුයේ ඉසේ ද ඉඟේ ද අත්වලද පිදේනි රැගෙනය. කොර සන්නිය බුරුල්ල කොළ ගැසූ යෂ්ටියක් රැගෙන සහාගත වේ. ගොළු සන්නිය තලප්පාවකින් හා කළු වස්ත්‍රයකින් සැරසේ. කණ සන්නිය කොල අතු ගැසූ ලීයක් රැගෙන එයි.

රැලි දැමූ සරමකින් සැරසුණු අමුක්කු සන්නිය දෙපාවල ගෙජ්ජිවලින් සමන්විතය. දෙමළ සන්නිය කන්වල කඩුක්කම් දමා ඇත. දේව සන්නියේ නෙලුම් මල් මෝස්තරය සහිත තෝඩු පත් දෙකකි. ගිනි ජල් සන්නිය කොළවලින් හෝ ගොක්කොළවලින් තැනූ ශීර්ෂ පළඳනාවකින් සමන්විතය. වෙඩිසන්නිය අතේ තුවක්කුවකි. ඇතැම් යක්ෂයන් අතේ දඬු මුගුරු කඩු ආදිය වේ. මේ අන්දමට තම

සැරසීම් හරහා ප්‍රේක්ෂකයාගේ මනස තුළ නව්‍යතාවක් හා දර්ශනකාමතාවක් ඇති කරවන මෙම ශිල්පීන් ආහර්ය වූ අංග මගින් ප්‍රේක්ෂකයාගේ මනෝ භාවයන්හි විවිධ ස්ථාන ස්පර්ශ කිරීමට සමත් වෙයි.

සන්නි යකුම ශාන්තිකර්මයේ පරමාර්ථය ලෙඩ රෝග දුර හැර ශාන්තිය උදා කර දීමයි. නමුදු තත් ක්‍රියාවලිය ප්‍රේක්ෂක මනස තුළ විශ්‍රාන්තියක් ඇති නොවන පරිදි සිදු කරනු සඳහා අභිචාරාර්ථය ඉක්මවා ගිය රසාන්විත දෘෂ්ටියක් මීට අන්තර්ගත කළ ශාන්තිකර්ම ශිල්පියා එමගින් අමනුෂ්‍ය සංකල්පය හා ප්‍රේක්ෂකයා අතර ගොඩනඟන අන්තර් සම්බන්ධය අඛණ්ඩය. එහිදී ශෘංගාර හාස්‍යාදී රසභාව උත්තේජනය සඳහා සතර අභිනයන්ගේ භාවිතය මෙම ශාන්තිකර්මය තුළ ආකර්ෂණීය ලෙස යොදාගන්නා අන්දම උක්ත කරුණු මගින් මනාව තහවුරු වේ.

දේමින්ද විජේතුංග

මාර/මහා මන්තින්ද පිරිවෙන් විද්‍යායතනය ,

මාතර